# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2277/59 – 2022 අප්‍රේල් 29 වැනි සිකුරාදා – 2022.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

04 වන සංශෝධනය

**ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් මස 11 දිනැති 1883/17 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද, ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි සඳහන් පරිදි නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 අප්‍රේල් මස 27 වැනි දින,

**I කොටස**

සංශෝධනය අංක 01 - 2016 අගෝස්තු මස 24 දිනැති අංක 1981/45 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රය
සංශෝධනය අංක 02 - 2016 දෙසැම්බර් මස 09 දිනැති අංක 1996/46 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රය
සංශෝධනය අංක 03 - 2021 මාර්තු මස 09 දිනැති අංක 2218/50 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රය

**II කොටස**

විශේෂඥ වෛද්‍ය/දන්ත වෛද්‍ය ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ පිළිගත් සුදුසුකම් දක්වෙන පරිශිෂ්ඨ I හි දැනට සඳහන් විශේෂඥතාවයන්ට අමතරව, නව ඇතුළත් කිරීමක් ලෙස පහත විශේෂඥතාවයන් ඇතුළත් කරනු ලැබේ.

| | විශේෂඥතාව | පිළිගත් සුදුසුකම් |
|---|---|---|
| 78 | සායනික පෝෂණය | එම්.ඩී. සායනික පෝෂණය |
| 79 | වෘද්ධ වෛද්‍ය විද්‍යාව | එම්.ඩී. වෘද්ධ වෛද්‍ය විද්‍යාව |
| 80 | ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාව | එම්.ඩී. ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය විද්‍යාව |
| 81 | වැඩිහිටි හෘදවේදය | එම්.ඩී. වෛද්‍ය විද්‍යාව |
| 82 | ප්‍රතිශක්තිවේදය* | එම්.ඩී. ප්‍රතිශක්ති විද්‍යාව |
| 83 | ප්‍රජා ළමා වෛද්‍යවේදය | එම්.ඩී. කෞමාරභෘත්‍යය |
| 84 | අණුක වෛද්‍යවේදය | එම්.ඩී. රසායනාගාර අණුක වෛද්‍ය විද්‍යාව |
| 85 | ස්නායු විකිරණ වේදය | එම්.ඩී. විකිරණ වෛද්‍ය විද්‍යාව |
| 86 | ළමා විකිරණවේදය | එම්.ඩී. විකිරණ වෛද්‍ය විද්‍යාව |
| 87 | සෞඛ්‍ය විඥාපනවේදය | එම්.ඩී. සෞඛ්‍ය විඥාපන විද්‍යාව |
| 88 | වෛද්‍ය පරපෝෂිතවේදය (මින් පෙර පරපෝෂිතවේදය ලෙස) | එම්.ඩී. වෛද්‍ය පරපෝෂිත විද්‍යාව |
| 89 | සායනික ස්නායු භෞතවේදය (මින් පෙර ස්නායු භෞතවේදය ලෙස) | එම්.ඩී. වෛද්‍ය විද්‍යාව |
| 90 | පුනරුත්තාපන වෛද්‍යවේදය | එම්.ඩී. වෛද්‍ය විද්‍යාව |
| 91 | ළමා (නව ජන්ම හා පරිසූතික වෛද්‍යවේදය) මින්පෙර නව ජන්ම වේදය පමණි. | එම්.ඩී. කෞමාරභෘත්‍යය |
| 92 | වයස්ගත මනෝ වෛද්‍යවේදය | එම්.ඩී. මනෝ වෛද්‍ය විද්‍යාව |
| 93 | ඇබ්බැහිවීම් පිළිබඳ මනෝ වෛද්‍යවේදය | එම්.ඩී. මනෝ වෛද්‍ය විද්‍යාව |
| 94 | ප්ලාස්ටික් සහ ප්‍රතිනිර්මාණ ශල්‍යවේදය (මින්පෙර ප්ලාස්ටික් ශල්‍යවේදය ලෙස) | එම්.ඩී. ශල්‍ය වෛද්‍ය විද්‍යාව |
| 95 | අමාශයික අන්ත්‍ර ශල්‍ය වේදය (මින් පෙර ආමාශ අන්ත්‍රික ශල්‍යවේදය ලෙස) | එම්.ඩී. ශල්‍ය වෛද්‍ය විද්‍යාව |
| 96 | රක්ත ව්‍යාධි පිළිකා වේදය | එම්.ඩී. සායනික පිළිකා වෛද්‍ය විද්‍යාව |
| 97 | ළමා සායනික පිළිකා වේදය | එම්.ඩී. සායනික පිළිකා වෛද්‍ය විද්‍යාව |
| 98 | ඉන්ද්‍රිය බද්ධ ශල්‍ය වේදය | එම්.ඩී. ශල්‍ය වෛද්‍ය විද්‍යාව |
| 99 | ළමා හෘද උරස් ශල්‍යවේදය | එම්.ඩී. ශල්‍ය වෛද්‍ය විද්‍යාව |

***සටහන:***

I. විශේෂඥ වෛද්‍ය නිලධාරී ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉහත I වන පරිශිෂ්ඨයේ සඳහන් පරිදි විශේෂඥතාවයට අදාළ පිළිගත් සුදුසුකම් සහ විශේෂඥතාවයට අදාළ මාණ්ඩලික සහතිකය ලබා තිබිය යුතුය.

II. *එම්. ඩී. වෛරස වෛද්‍ය විද්‍යාව හෝ එම්. ඩී. ක්ෂුද්‍ර ජීව වෛද්‍ය විද්‍යාව සමග, ප්‍රතිශක්ති වෛද්‍ය විද්‍යාව පිළිබඳව දේශීයව හෝ විදේශීයව එම්. ඩී. උපාධිය ලබා ගැනීමෙන් පසු අඩුම වශයෙන් වසරක පුහුණුවක් ලබා තිබීම විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සලකා බලනු ලැබේ.

වෛද්‍ය නිලධාරී/ දන්ත වෛද්‍ය නිලධාරී II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ පිළිගත් සුදුසුකම් දක්වෙන පරිශිෂ්ඨ - II හි දැනට සඳහන් විශේෂඥතාවයන්ට අමතරව, නව ඇතුළත් කිරීමක් ලෙස පහත විශේෂඥතාවයන් ඇතුළත් කරනු ලැබේ.

| | විශේෂඥතාවය | පිළිගත් සුදුසුකම් |
|---|---|---|
| 32 | වෛද්‍ය අධ්‍යාපනය | වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති |
| 33 | සංග්‍රාමික වෛද්‍ය වේදය | සංග්‍රාමික වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති |
| 34 | සායනික ඖෂධවේදය සහ චිකිත්සනය | සායනික ඖෂධවේදය සහ චිකිත්සනය පිළිබඳ විද්‍යාපති |
| 35 | වෝහාරික වෛද්‍යවේදය | වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති |
| 36 | වෛද්‍ය ධූලකවේදය | වෛද්‍ය ධූලකවේදය පිළිබඳ විද්‍යාපති |
| 37 | වෘද්ධ වෛද්‍ය විද්‍යාව | වෘද්ධ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| 38 | සහන වෛද්‍ය වේදය | සහන වෛද්‍ය වේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| 39 | වෛද්‍ය ධූලකවේදය | වෛද්‍ය ධූලකවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |

*සටහන:*

පළමු වන පරිශිෂ්ඨයේ සඳහන් වෛද්‍ය විශාරද උපාධිය හෝ වෛද්‍ය විශාරද උපාධියේ පළමු කොටසට හෝ දෙවන කොටසට අදාළ විභාගය සාර්ථකව සම්පූර්ණ කර තිබීම II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පිළිගත් සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට අදාළ පරිශිෂ්ඨය - III හි දැනට සඳහන් තනතුරුවලට අමතරව නව ඇතුළත් කිරීමක් ලෙස පහත තනතුර එම වගුවට ඇතුළත් කරනු ලැබේ:

| | ආයතනය | තනතුර | ආයතන ගණන | තනතුරු ගණන |
|---|---|---|---|---|
| 49 | සෞඛ්‍ය විෂයය යටතේ පවතින කැබිනට් නොවන අමාත්‍යාංශය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 | 01 |

ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට අදාළ පරිශිෂ්ඨය - IV හි දැනට සඳහන් තනතුරුවලට අමතරව නව ඇතුළත් කිරීමක් ලෙස පහත තනතුරු එම වගුවට ඇතුළත් කරනු ලැබේ:

| | ආයතනය | තනතුර | ආයතන ගණන | තනතුරු ගණන |
|---|---|---|---|---|
| 59 | සෞඛ්‍ය විෂයය යටතේ පවතින කැබිනට් නොවන අමාත්‍යාංශ | අධ්‍යක්ෂ | 02 | 03 |
| 60 | සෞඛ්‍ය විෂයය යටතේ පවතින කැබිනට් නොවන අමාත්‍යාංශ | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 | 02 |

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියට අදාළ පරිශිෂ්ඨය - V හි දැනට සඳහන් තනතුරුවලට අමතරව නව ඇතුළත් කිරීමක් ලෙස පහත තනතුරු එම වගුවට ඇතුළත් කරනු ලැබේ.

| ආයතනය | තනතුර | ආයතන ගණන | තනතුරු ගණන |
|---|---|---|---|
| සෞඛ්‍ය විෂයය යටතේ පවතින කැබිනට් නොවන අමාත්‍යාංශ | අතිරේක ලේකම් | 02 | 02 |

EOG 04 - 0214

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.